මගේ අංකය : ආර්පී ………………….

පර්යේෂණ හා ප්‍රකාශන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

2024..............................

ආචාර්ය ………………….. මිය/ මයා
…………………..අධ්‍යයනාංශය
……………………..පීඨය

මහත්මියනි/ මහත්මයාණෙනි,

## පර්යේෂණ ප්‍රතිපාදන

**මාතෘකාව :** ………………….

ඉහත මාතෘකාව යටතේ පර්යේෂණයක් කිරීම සඳහා ඔබ සහ අනු පර්යේෂකවරයන් වන ......................................................................................................................................... විසින් ඉදිරිපත් කරන ලද …………………..දිනැති අයදුම්පත ………………….. දින පැවති අංක …………………..දරන පර්යේෂණ හා ප්‍රකාශන කමිටුව පිළිගත්නා ලද බවත්, ඒ අනුව ………………….. දින පැවති අංක ………………….. දරන පාලක සභාවෙන් ඔබ වෙත රු.…………………..ක මුදලක් ප්‍රදානය කිරීම අනුමත කරන ලද බවත් සතුටින් දන්වමි.

01 ඔබේ පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා වන යොමු අංකය **ආර්පී**…………………..බව සලකන්න. මේ සම්බන්ධ සියලු ලිපි ලේඛන හා ගිණුම් කටයුතුවල දී මෙම අංකය අනිවාර්යයෙන් සඳහන් කළ යුතුය.

02. මෙම පර්යේෂණ ප්‍රතිපාදනය පහත සඳහන් කොන්දේසිවලට යටත්ව ප්‍රදානය කරනු ලැබේ.

i පර්යේෂණය සිදුකිරීම සඳහා වසර …………………..ක කාලයක් ඔබ වෙත ලබා දී ඇත.

ii පර්යේෂණ ප්‍රතිපාදන ලබා ගැනීමට පෙර ඊට අදාළ ගිවිසුමකට එළැඹිය යුතුය. පර්යේෂණ ව්‍යාපෘතියේ ආරම්භක දිනය ලෙස ගිවිසුම් අත්සන් කරන දිනය සලකනු ලැබේ. මෙම ලිපියේ සඳහන් දින සිට දින 14 ක කාලයක් තුළ ගිවිසුම අත්සන් කළ යුතු ය. එසේ කිරීමට අපොහොසත් වුවහොත් මෙම ප්‍රදානය අවලංගු කරනු ලැබේ. කෙසේ වුව ද, පිළිගත හැකි හේතුවක් මත මෙම කාලය දීර්ඝ කර ගත හැකි ය.

iii අදාළ පර්යේෂණ ව්‍යාපෘතිය හැර වෙනත් කිසිදු කාර්යයක් වෙනුවෙන් මෙම මුදල නොයෙදිය යුතුය. පර්යේෂණයට අදාළ මිලදීගැනීම් විශ්වවිද්‍යාලයේ මුදල් රෙගුලාසි අනුව සිදු කළ යුතුය.

iv පර්යේෂණ ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීම් අදාළ අධ්‍යයනාංශ ප්‍රධානගේ මාර්ගයෙන් පීඨාධිපතිගේ නිර්දේශය සහිතව පර්යේෂණ හා ප්‍රකාශන අංශය වෙත ඉදිරිපත් කළ යුතුය.

v එක් වාරිකයක් සඳහා ලබා ගත හැක්කේ අනුමත මුදලින් 25%කි. එසේ වුවද විශේෂ අවස්ථාවන්හි (උදාහරණයක් වශයෙන් කිසියම් උපකරණයක් හෝ රසායන ද්‍රව්‍යයක් මිල දී ගැනීම සඳහා 25%ක මුදල ප්‍රමාණවත් නොවන අවස්ථාවක) අධ්‍යයනාංශ ප්‍රධානගේ හා පීඨාධිපතිගේ නිර්දේශ මත අනුමත මුදලින් 50%ක හෝ මුළු මුදල ම ගෙවීම සලකා බලනු ලැබේ. ප්‍රථම වාරිකය ලබාගත් පසු ඊළඟ වාරික ලබා ගැනීමට ඉල්ලුම් කිරීමේ දී නියමිත කාලවකවානු අනුව නිසි පරිදි අදාළ ප්‍රගති වාර්තා ඉදිරිපත් කර තිබිය යුතුය.

vi පර්යේෂණ ප්‍රතිපාදන, පර්යේෂණ සහකාරවරුන්ට ගෙවීම් සඳහා භාවිතා කළ නොහැකි අතර, දත්ත රැස්කිරීම, තාක්ෂණ ශිල්පීන්ගේ සේවාවන් ආදිය සඳහා දෛනික පදනම මත ගෙවීම් කළ හැකිය. එම දීමනා අනුමත කළ සීමාවන් තුළ විය යුතු ය.

vii පර්යේෂණ ව්‍යාපෘතිය සම්බන්ධ සියලු වියදම් (ගමන් වියදම්, යැපීම් දීමනාද ඇතුලුව) වෙන් කරන ලද මුදලින් දැරිය යුතුය. (උදාහරණයක් සඳහා මේ සඳහා විශ්වවිද්‍යාලයේ වාහනයක් ප්‍රයෝජනයට ගනු ලැබුවහොත් ඒ සඳහා වන වියදම් අනුමත ප්‍රදානයෙන් අඩු කරනු ලැබේ).

viii මෙම මුදලින් කිසියම් භාණ්ඩයක් හෝ උපකරණයක් මිල දී ගතහොත් එය ඔබ අයත් අධ්‍යයන අංශයේ දේපලක් බවට පත්වන බැවින් ඒවා අධ්‍යයන අංශයේ තොග සමීක්ෂණ පොතට (ඉන්වෙන්ට්‍රියට) ඇතුළත් කළ යුතුය.

ix එක් පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා ලබා දෙන උපරිම මුදල රුපියල් 300,000.00 කි. එසේ වුවද, ව්‍යාපෘතියේ ප්‍රගතිය ඇගයීමෙන් අනතුරුව, පර්යේෂණ ව්‍යාපෘතියේ දිගුවකට අදාළ අතිරේක අයවැය වාර්තාවක් සළකා බැලීමට කටයුතු කළ හැකිය.

x පර්යේෂණ කටයුතු සඳහා මිලදී ගන්නා පොත්පත්, සඟරා, මෛක්‍රෝ ෆිල්ම්ස් හා ස්ලයිඩ්ස් ආදිය පර්යේෂණ අවසානයේ දී, විශ්වවිද්‍යාලයේ පොදු ප්‍රයෝජනය සඳහා අදාළ අධ්‍යයන අංශයට හෝ පුස්තකාලයට භාර දිය යුතුය. විද්‍යා හා වෛද්‍ය පීඨවලට අදාළ පර්යේෂණ කටයුතු සඳහා මිලදී ගත් රසායන ද්‍රව්‍ය පර්යේෂණ කටයුතු නිමවීමෙන් පසු ඉතිරියක් වේ නම් ඒවා අදාළ අධ්‍යයන අංශයට භාරදිය යුතුය.

xi පර්යේෂණ කටයුතු පිළිබඳව ප්‍රගති වාර්තා නිර්දේශිත ආකෘතිය අනුව සෑම හය මසකට වරක්ම ඉදිරිපත් කළ යුතුය. ප්‍රගති වාර්තා නිසි කලට ඉදිරිපත් කරනු නොලැබුවහොත් ඒ අනුව ප්‍රතිපාදන ගෙවීම අත්හිටවනු ලැබේ.

xii ප්‍රධාන පර්යේෂකවරයා විසින්, යම් පර්යේෂණ ව්‍යාපෘතියක් කරගෙන යාම තාවකාලිකව (මාස 06ක් හෝ වැඩි කාලයක් සඳහා) නොහැකි වන අවස්ථාවන්වලදී ඔහු/ඇය ඒ පිළිබඳව පර්යේෂණ හා ප්‍රකාශන කමිටුව දැනුවත් කළ යුතු අතර, ඒ සඳහා සුදුසු විකල්ප විධිවිධානයන් සකස් කළ යුතු ය. (උදා: සුදුසු ආචාර්යවරයෙකු නම් කිරීම)

xiii ප්‍රධාන පර්යේෂකවරයාගේ පාලනයෙන් ඔබ්බට ගිය හේතු නිසා පර්යේෂවරයෙකුට පූර්ව ක්‍රියාකාරී සැලැස්මෙන් බැහැරවීමට සිදුවුවහොත්, ඔහු/ඇය ප්‍රමාණවත් සාධාරණීකරණයන් හා යෝජිත විකල්ප ක්‍රියාමාර්ග සමඟ වාර්තා කළ යුතුය.

xiv නිශ්චිත කාල සීමාව තුළ පර්යේෂණ ව්‍යාපෘතිය නිම කළ යුතුය. කාලසීමාව දීර්ඝ කිරීමක් අදාල ප්‍රගති වාර්තා ආකෘතියේ අංක 4 යටතේ සඳහන් කරුණු පිළිබඳව අනුමැතියක් අවශ්‍ය වන්නේ නම් එයට පිළිගත හැකි හේතු සාධක සහිතව අධ්‍යයන අංශ ප්‍රධාන හා පීඨාධිපති මගින් ඉල්ලීමක් කල යුතුය.

xv පර්යේෂණ ප්‍රතිපාදන සඳහා ලබා දෙන කාලය පහත සීමාවන්ට යටත්ව එක් වරකට මාස 06 සිට මාස 12ක කාලයක් දක්වා දීර්ඝ කරනු ලැබේ.

| අනුමත පර්යේෂණ කාල සීමාව | දීර්ඝ කළ හැකි උපරිම කාල සීමාව |
|---|---|
| වසර 01 | වසර 02 |
| වසර 02 | වසර 04 |
| වසර 03 | වසර 05 |

xvi අදාළ පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා ලබා දී ඇති කාල සීමාව (දීර්ඝ කරන ලද කාලය ද ඇතුලුව) අවසන් වන දිනය වන විට ව්‍යාපෘතිය අවසන් නොවූවද, පර්යේෂකවරයා විසින් ව්‍යාපෘතියේ එතෙක් ප්‍රගතිය සම්බන්ධයෙන් අවසන් වාර්තාවක් සම්පූර්ණ ගිණුම් වාර්තාවක් සමග පර්යේෂණ හා ප්‍රකාශන අංශයට ඉදිරිපත් කළ යුතු ය. එම වාර්තාව පර්යේෂණ ව්‍යාපෘතියේ කාලය අවසන් වන දින සිට මාස 03ක් තුල ඉදිරිපත් කළ යුතු ය.

xvii(a) මෙම ව්‍යාපෘතියට අදාළව අවසානයේ සකස් කරනු ලබන ව්‍යාපෘති වාර්තාව පිටපත් තුනකින් යුතුව පැහැදිලිව යතුරුලියනය කර හෝ ඡායා පිටපත් කර හෝ පර්යේෂණ හා ප්‍රකාශන අංශය වෙත ඉදිරිපත් කළ යුතුය. යතුරුලියන කඩදාසි ඒ4 (මි.මී.210x297) ප්‍රමාණයෙන් විය යුතු අතර, මුල් පිටපත මෘදු බැම්මෙන් (soft bound) සකස් කිරීම ප්‍රමාණවත්ය. වාර්තා ඇගයීමෙන් පසුව සංශෝධිත අවසන් වාර්තාවේ පිටපත් ඝන කවරයෙන් සමන්විත විය යුතුය (රෙක්සින් හෝ සම් බැම්ම). වාර්තාව යතුරුලියනය කිරීමේදී පිටුවේ වම් පැත්තෙන් සෙ.මී. 3ක තීරයක්ද, දකුණු පැත්තෙන් සෙ.මී. 1.5ක තීරයක් ද ඉඩ හැරිය යුතුය. යතුරුලියනය කිරීමේදී පේළි අතර පරතරය 1 1/2"ක හෝ 2"ක ඉඩකින් විය යුතුය. උධෘතය පාඨයක් නම් පේළි අතර පරතරය තනි ඉඩක් (Single Space) තැබීම ප්‍රමාණවත් වේ. අක්ෂර ප්‍රමාණය 12pt විය යුතු අතර, සිංහල භාෂාවෙන් සකස් කරනු ලබන වාර්තා සඳහා 'අභය' හෝ වෙනත් සුදුසු අක්ෂර මාදිලියක්ද, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරනු ලබන වාර්තා සඳහා Times New Roman අක්ෂර මාදිලිය ද භාවිතා කළ යුතුය.

(b) පර්යේෂණ ව්‍යාපෘතිය පදනම් කරගෙන සගරා මුද්‍රණය කිරීමේදී ඒ සඳහා පර්යේෂණ ප්‍රතිපාදන ලබා ගත් බව සඳහන් කළ යුතු ය.

(c) අවසාන වාර්තාවේ මෘදු පිටපතක් ද PDF ආකාරයට ඉදිරිපත් කළ යුතු ය.

(d) පර්යේෂණ ප්‍රතිපාදන ලබා ගෙන සිදු කරනු ලබන පර්යේෂණ ව්‍යාපෘති හා සම්බන්ධ සම්පූර්ණ වාර්තාවක් ප්‍රකාශයට පත් කර ඇති බවට ප්‍රමාණවත් දත්ත තිබේ නම් එවැනි අවස්ථාවලදී අවසන් වාර්තාව ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

xviii(a) පර්යේෂණ වාර්තාව පර්යේෂණ හා ප්‍රකාශන කමිටුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එය ඇගයීම සඳහා අංශාධිපතිගේ හා පීඨාධිපතිගේ නිර්දේශ මත හෝ අවශ්‍ය යැයි හැඟෙන අවස්ථාවක දී කමිටුවේ තීරණය පරිදි පරීක්ෂකවරයෙකු පත් කරනු ලැබේ. හැකි සෑම අවස්ථාවකදීම පර්යේෂණ ව්‍යාපෘති යෝජනා ඇගයීමට ලක්කල පරීක්ෂකවරයා අවසන් වාර්තාව ඇගයීමට ද යෙදවීමට උත්සාහ දරනු ලැබේ. ඇගයීමෙන් පසුව සංශෝධිත අවසන් වාර්තාව අංශාධිපතිගේ හා පීඨාධිපතිගේ නිර්දේශ සමග පර්යේෂණ හා ප්‍රකාශන අංශය වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඉන් පිටපතක් පුස්තකාලයටද, තවත් පිටපතක් අදාළ අධ්‍යයන අංශයට හා අයදුම්කරුට ද සහතික කොට නිකුත් කරනු ලැබේ.

(b) සංශෝධිත අවසාන වාර්තාවේ මෘදු පිටපතක් ද PDF ආකාරයට ඉදිරිපත් කළ යුතු ය.

xix මීට ඉහත විශ්වවිද්‍යාලයීය අභ්‍යන්තර පර්යේෂණ ආධාර ලබාගෙන පර්යේෂණ සිදු කර තිබේ නම්, ඒ හා සම්බන්ධව අවම වශයෙන් එක් පර්යේෂණ සංක්ෂිප්තයක් (abstract) හෝ ප්‍රකාශයට පත් කිරීම අනිවාර්ය වේ.

මේ දක්වා එවැනි පර්යේෂණ සංක්ෂිප්තයක් (abstract) ප්‍රකාශයට පත් කර නොමැති නම් එවැන්නක් ප්‍රකාශයට පත්කර පර්යේෂණ හා ප්‍රකාශන අංශය වෙත දැනුම් දෙන තුරු දැනට අනුමත කර ඇති මෙම පර්යේෂණ ව්‍යාපෘති සඳහා වුව ද මුදල් නිදහස් නොකරනු ඇත.

තව ද, ඉදිරියේදී පර්යේෂණ ආධාර අනුමත කිරීමේදී මෙම පර්යේෂණ ව්‍යාපෘතිය සම්බන්ධ සංක්ෂිප්තයක් (abstract) පළකර තිබේ ද යන්න සලකා බලනු ලැබේ.

xx ඔබ විසින් ලබා ගත් පර්යේෂණ ප්‍රතිපාදන රු. 300,000.00 - රු. 500,000.00 අතර නම් අදාල පර්යේෂණ ව්‍යාපෘතිය අවසන් වන දින සිට වසර 05ක් තුළ එහි සම්පූර්ණ වාර්තාවක් ප්‍රකාශයට පත් කර තිබීම අනිවාර්ය වේ. එසේ නොමැති නම් පර්යේෂණ ව්‍යාපෘතිය ප්‍රකාශයට පත් කරන තුරු ඉදිරියේදී විශ්වවිද්‍යාලයෙන් ප්‍රදානය කරනු ලබන පර්යේෂණ ප්‍රතිපාදන සඳහා සලකා බලනු නොලැබේ.

xxi පර්යේෂණ ව්‍යාපෘතිය මත පදනම් වූ පර්යේෂණ වාර්තා විශ්වවිද්‍යාලයේ වාර්ෂික අධ්‍යයන සැසිවාරවලදී ඉදිරිපත් කිරීමටද උනන්දු කරනු ලැබේ.

03. සෑම වර්ෂයකදීම, උපකුලපති තිළිණ ප්‍රදානය සඳහා සැලකිල්ලට ගන්නා කාල සීමාව තුළ අවසන් කර ඇති අභ්‍යන්තර පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රතිඵල අනුව ප්‍රකාශයට පත්කළ පර්යේෂණ සංක්ෂිප්තයන් (abstracts) හා පර්යේෂණ ප්‍රකාශන (publications) ප්‍රමාණයත් එම පර්යේෂණ ප්‍රකාශන පළ කර ඇති සඟරාවල Impact Factor ත් සැලකිල්ලට ගෙන විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ආධාර ලබාගත් හොඳම පර්යේෂකයා තෝරා එම ආචාර්ය භවතාට උපකුලපති සම්මාන ප්‍රදානය කරනු ලැබේ.

මෙයට
විශ්වාසී

වැඩ බලන නියෝජ්‍ය ලේඛකාධිකාරී
පර්යේෂණ හා ප්‍රකාශන අංශය

පිටපත් : - 1. පීඨාධිපති/ ………………….පීඨය
2. අංශ ප්‍රධාන/ …………………. අධ්‍යයනාංශය
3. මූල්‍යාධිකාරී
4. නියෝජ්‍ය ලේඛකාධිකාරී/ ආයතන අධ්‍යයන
5. නියෝජ්‍ය මූල්‍යාධිකාරී / ගෙවීම් අංශය
6. ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක

සටහන : අදාළ ගිවිසුම් පත්‍රයේ පිටපත් 03ක්, ප්‍රගති වාර්තා හා අවසන් වාර්තා සකස් කිරීමට අදාළ ආකෘතිපත්‍රයේ සහ නිර්ණායකයේ පිටපතක් සහ පර්යේෂණ කාලය දීර්ඝ කිරීමේ ආකෘති පත්‍රයේ පිටපතක් ද මේ සමඟ එවමි.

Recommended At R & P Meeting No 2024/01, Senate meeting No 384 & 524th meeting of the Council.